# කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
# முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
# DEPARTMENT OF MANAGEMENT AUDIT

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு | MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01 | செயலகம், கொழும்பு 01 | The Secretariat, Colombo 01


මගේ අංකය / எனது இல / My No: DMA/CIR/2019

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2023.07 . 25

**කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක: DMA/01-2019 ලිපි අංක 03**

අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,

<u>අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ</u>

මෙම දෙපාර්තමේන්තුව මගින් 2020 දෙසැම්බර් මස නිකුත් කරන ලද රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණකවරුන්ගේ අත්පොතෙහි 9 වන පරිච්ඡේදය ( විගණන හා කළමනාකරණ කමිටු) සහ 2019.01.12 දිනැතිව නිකුත් කරන ලද කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක : DMA/01-2019හි ඇමුණුම් අංක 01 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කෙරේ.

**01.** **<u>විගණන හා කළමනාකරණ කමිටුවල ගණපූර්ණය</u>**

හැකි සෑම විටම මෙම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශවල සඳහන් විගණන කමිටු සාමාජිකයන්ගේ පූර්ණ සහභාගීත්වයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. කෙසේ වෙතත් කමිටු සභාපති නොවන සාමාජිකයෙකුට නොවැළැක්විය හැකි හේතුවක් නිසා පැමිණීමට නොහැකි වූ විට කමිටු සභාපති සහ තවත් එක් සාමාජිකයෙකුගේ සහභාගීත්වයෙන් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය හැකිය.

**02.** මෙම දෙපාර්තමේන්තුවේ පවතින කාර්යමණ්ඩල ප්‍රමාණය සැළකිල්ලට ගෙන සියලුම දෙපාර්තමේන්තුවල කළමනාකරණ විගණන කමිටුවලට මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු සහභාගී කරවීමේ දුෂ්කරතාවයන් පවතී. ඒ අනුව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු අදාල දෙපාර්තමේන්තුවේ කළමනාකරණ විගණන කමිටුවට පත් කර ඇති විට හා පත් කර නොමැති විට දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටුවල සංයුතිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.


කාර්යාලය / அலுவலகம் / Office: 2484816, 2484500, 2484600, 2484700
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 2484543
ෆැක්ස් / பெக்ஸ் / Fax: 2449496
වෙබ් අඩවිය / வெப் சைட் / website: www.treasury.gov.lk

**02.1 කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු නිලධාරියෙකු කමිටු සමාජික ලෙස පත් කර ඇති විට දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය**

1. දෙපාර්තමේන්තු ප්‍රධානියා - සභාපති
2. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී - සාමාජික
3. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ නියෝජිත - සාමාජික
4. අදාල අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක - නිරීක්ෂක
5. ජාතික විගණන කාර්යාලයේ නියෝජිත - නිරීක්ෂක
6. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක - කැඳවුම්කරු

**02.2 කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු නිලධාරියෙකු කමිටු සාමාජික ලෙස පත් කර නොමැති විට දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය**

1. දෙපාර්තමේන්තු ප්‍රධානියා - සභාපති
2. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී - සාමාජික
3. අදාල අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක - සාමාජික
4. ජාතික විගණන කාර්යාලයේ නියෝජිත - නිරීක්ෂක
5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක - කැඳවුම්කරු

මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වේ නම් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂගේ අංක 011-2484529 දරණ දුරකථනය ඔස්සේ ලබා ගත හැක.

එස්.ඒ. චන්ද්‍රිකා කුලතිලක
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්- 1. විගණකාධිපති
2. පළාත් ප්‍රධාන ලේකම්වරුන්